" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "
ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

SLSI SYSTEM CERTIFIED ISO 9001

SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk

පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

මගේ අංකය / எனது இலக்கம் / My No. CSWP/FIN-AP/03/FI/02(A)
ඔබේ අංකය / உமது இலக்கம் / Your No.
දිනය / திகதி / Date 2021.04.06

**<u>බස්නාහිර පළාත්</u>**

**<u>ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2021</u>**

**බස්නාහිර පළාතේ,**
**සියළුම ලේකම්වරුන්,**
**පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන වල**
**සභාපතිවරුන් වෙත.**

**<u>පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල</u>**
**<u>කාර්ය මණ්ඩලට 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම.</u>**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2020.12.18 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 03/2020හි දැක්වෙන උපදෙස් සැලකිල්ලට ගෙන පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලයට 2020 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇත.

01. ප්‍රසාද දීමනා ගෙවීම.

2020 වර්ෂය සඳහා පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල කාර්ය මණ්ඩලට පහත පරිදි ප්‍රසාද දීමනා ගෙවීම් කල හැකිය.

| අනු අංකය | ආයතනයේ වර්ගය | යෝජිත ප්‍රසාද දීමනාව රු. |
|---|---|---|
| 01 | 2018 මූල්‍ය වර්ෂයේ අලාභදායී තත්ත්වය 2019 මූල්‍ය වර්ෂය තුල ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුලත්ව 2019 මූල්‍ය වර්ෂය තුල දී ලාභ උපයාගෙන ඇති සහ පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත <u>දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ</u> පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන . | 15,000.00 |
| 02 | 2018 මූල්‍ය වර්ෂයේ අලාභදායී තත්ත්වය 2019 මූල්‍ය වර්ෂය තුල දී ලාභදායී බවට පත් කර ගෙන ඇති ආයතනද ඇතුලත්ව 2019 මූල්‍ය වර්ෂය තුල දී ලාභ උපයාගෙන ඇති සහ පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත <u>දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති</u> පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන . | 13,500.00 |

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதான செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

| | | |
|---|---|---|
| 03 | 2019 මූල්‍ය වර්ෂය තුලදී අලාභ තත්වයක් වාර්තා කර ඇති, එහෙත් 2018 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව එම **අලාභදායී බව අඩුකරගෙන ඇති** පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන . | 5,000.00 |
| 04 | 2018 මූල්‍ය වර්ෂය තුල දී අලාභ තත්වයක් වාර්තා කර ඇති හා එම **අලාභදායී බව 2019 මූල්‍ය වර්ෂය තුලදී අඩු කර ගැනීමට අපොහොසත් වූ** පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන, එවැනි ආයතනවල සේවය කරන සේවකයින් කෙරෙහි සානුකම්පිතව සලකා බලා . | 3,000.00 |

02. ප්‍රධාන ලේකම්ගේ එකගත්වය.

අදාල මුදල් වර්ෂය තුල අලාභදායී තත්වයක් වාර්තාකර ඇති පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතන කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීමට ප්‍රථමයෙන් ප්‍රධාන ලේකම්ගෙන් එකගතාව ලබා ගත යුතුය. මේ සඳහා අදාල අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කල යුතුය.

03. අනුගමනය කල යුතු පිළිවෙල

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සියකාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් ලෙස සැලකීමට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

3.3 ඉහත ප්‍රසාද දීමනා ගෙවීම සඳහා, අදාල පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවල වාර්ෂික ගිණුම් නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, රජය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධයෙන් උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

04. විශේෂ කරුණු

4.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මුදල් පළාත් භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මඟින් වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන පළාත් සභා අධිකාරී/ව්‍යවස්ථාපිත ආයතනවලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

4.3 ඉකුත් වර්ෂවලදී සාමාන්‍ය පටිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගත් සහ මෙම වසරේදී ද එකී පරිපාටියම අනුගමනය කිරීමට අදහස් කරන ආයතන 2020 වර්ෂය වෙනුවෙන් එසේ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව ආණ්ඩුකාරතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

4.4 ප්‍රසාද දීමනා ගෙවනු ලබන,පළාත් සභා අධිකාරි/ ව්‍යවස්ථාපිත ආයතන විසින් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් සියල්ල අදාල අණ පණත් අනුව ගෙවීමට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරීන් බැඳී ඇති බැවින් ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉල්ලනු ලබන අවස්ථාවේ පවත්නා තත්වය පිළිබඳ වාර්තා කිරීමටත් වග බලා ගත යුතුය.

ජේ.එම්.සී.ජයන්ති විජේතුංග,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් .
පළාත් භාණ්ඩාගාර ලේකම්,
බස්නාහිර පළාත.

පිටපත්: i. ආණ්ඩුකාර ලේකම් (බ.ප.)
ii. විගණකාධිපති.
iii. සියළු නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (බ.ප.)
iv. අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) (බ.ප.)
v. තොරතුරු තාක්ෂණ නිලධාරී